# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ

# ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයේ

# **SL-02-2016** වැටුප් කේතය අයත් සේවා ගණයේ

# ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වන වාර්ෂික

# ස්ථාන මාරු පටිපාටිය

## 1. ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු

### 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022/12/14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධාන හා ඉදිරියේදී කලින් කලට ඇතිවන්නා වූ සංශෝධනයන් වලට අනුව, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයේ SL-02-2016 වැටුප් කේතය අයත් සේවා ගණයේ ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

### 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

වාර්ෂික ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන වෛද්‍ය නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටුකිරීම සඳහාත් එමෙන්ම දීපව්‍යාප්ත වෛද්‍ය සේවාව අඛණ්ඩව සමානාත්මකව පවත්වා ගෙන යාම සඳහාත් වර්තමාන සේවා ස්ථානයේ උපරිම වසර හතරක සේවා කාලය හෝ අවම වශයෙන් වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කළ වෛද්‍ය නිලධරයෙකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීම සඳහාත් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කෙරේ. මෙම මාරුවීම් වර්ෂයේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

2.1. එකම සේවා ස්ථානයක වසර 04 ට වැඩි කාලයක් හෝ ස්ථාන මාරු ක්‍රියාත්මක වන වර්ෂයේ ජනවාරි 01 දිනට වසර 04 ක සේවා කාලයක් සම්පූර්ණ කරන සියළුම ශ්‍රේණි වෛද්‍ය නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට අනිවාර්යයෙන්ම යටත් වන්නේය.

2.1.1. වාර්ෂික ස්ථානමාරු නියෝගය ලද දින සිට වසර 4ක් ගත වූ සහ, වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවන වසරට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර, ඉහත වාර්ෂික ස්ථාන මාරු නියෝගය අනුව අදාල සේවා ස්ථානයට සේවයට වාර්තාකළ නිලධාරීන්.

2.2. එලෙස වාර්ෂික ස්ථාන මාරුවීම්වලට අනිවාර්යයෙන්ම යටත් වන ශ්‍රේණි වෛද්‍ය නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන් අයදුම් කළ යුතු අතර, එය අදාල වෛද්‍ය නිලධරයාගේ වගකීමකි.

2.3. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර දෙකක් (02) සේවය කර තිබීම වාර්ෂික ස්ථාන මාරුවීමක් සඳහා අයදුම් කිරීමට සුදුසුකම වේ. නමුදු වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කරන්නේ නම් එය ආයතන ප්‍රධානියා හරහා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය වෙත දැන්විය යුතු අතර, යෝජිත නාම ලේඛනයට නම ඇතුලත් වූ පසු අයදුම් කිරීමෙන් වලකින්නේ නම් වාර්ෂික ස්ථාන මාරු සඳහා යෝජිත නාම ලේඛනය ප්‍රකාශයට පත් කළ දින සිට, සති දෙකක කාල සීමාව තුලදී තම ඉල්ලීම ඉවත් කර ගත යුතු වේ. එසේ නොකලහොත් වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් නිකුත් කරනු ලබන අතර, පසුව ඉල්ලීමක් කොට ඉවත් විය නොහැක.

2.4 පශ්චාත් උපාධි පාඨමාලා අවසන් කිරීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත වාර්තා කරන වෛද්‍ය නිලධාරීන්, වැටුප් රහිත නිවාඩු අවසන් කොට යලි සේවයට වාර්තා කරන වෛද්‍ය නිලධාරීන්, සහ ද්විතීය පදනම මත මුදාහැර සිට නැවත සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයට වාර්තා කල නිලධාරීන්, එසේ වාර්තා කරන්නේ පවත්නා වර්ෂයේ ජූනි 30 දිනට පෙර නම්, එම වසරේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන්ම නම ඇතුලත් වේ. ජූලි මස පළවෙනිදා හෝ ඊටපසු එලෙස වාර්තා කරන නිලධාරීන් ඊලඟ වසරේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන්ම නම ඇතුලත් වේ.

3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින් හී 250(III) හි විධිවිධාන අනුව පත් කෙරේ.

4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර:

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 254(II) හි විධිවිධාන අනුව පත් කෙරේ.

5. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු.

5.1. සියළුම වාර්ෂික ස්ථාන මාරු නියෝග අදාල වර්ෂයේ ජනවාරි 01 දින සිට බලාත්මක වේ. යම් අයුරකින් අදාල වාර්ෂික ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වීමට කල්ගත වූවහොත් එම ස්ථාන මාරු නියෝගය බලාත්මක වන දිනය එම වර්ෂයේ ජනවාරි 01 දින ලෙස සලකනු ලැබේ.

5.2. ස්වාමි පුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම වෛද්‍ය නිලධාරීන් වන විටදී දෙදෙනාම වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරන අවස්ථාවක එකම සේවා ස්ථානයක් හෝ සමීප සේවා ස්ථානයක් ලබාදෙන ලෙස ඔවුන් ඉල්ලීමක් කොට ඇත්නම් වෛද්‍ය නිලධාරීන් දෙදෙනාගෙන් ජ්‍යෙෂ්ඨතාවයෙන් වැඩි වෛද්‍ය නිලධරයා හට ස්ථාන මාරු නියෝගය ලබාදීම සලකා බලනුයේ ජ්‍යෙෂ්ඨතාවයෙන් අඩු වෛද්‍ය නිලධරයා හට ස්ථාන මාරු නියෝගය ලබාදීමෙන් පසුවය.

5.3 යම් වෛද්‍ය නිලධාරියෙකු තම වෛද්‍ය හේතූන් මත වර්තමාන සේවා ස්ථානයේම තව දුරටත් රැඳීසිටීමට අපේක්ෂා කරන්නේ නම්, තම ඉල්ලීම ඉදිරිපත් කරන දිනට ආසන්නතම වසර තුල විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකුගේ නිර්දේශ මත රජය පිළිගත් වෛද්‍ය ආයතනයකින් ලබා ගත් වෛද්‍ය සහතික හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර ආසන්නතම වසරට පෙර නිකුත් කරන ලද වෛද්‍ය සහතික හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේ නම් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා II) මගින් පත් කරනු ලබන වෛද්‍ය මණ්ඩලයක් මගින් නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව එම නිර්දේශ මත ආසන්නතම වාර්ෂික ස්ථාන මාරුවලට යටත්ව සේවා කාලය දීර්ඝ කිරීම සිදු කරයි.

5.4 වෛද්‍ය නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා දෙන අනුපිළිවෙලෙහි පදනම වන්නේ අදාල වෛද්‍ය නිලධාරීන්ගේ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවයයි. වැටුප් රහිත නිවාඩු ලබාගත් කාලය ජ්‍යෙෂ්ඨතාවය ගණනය කිරීමේදී අඩු කරනු ලැබේ. සංශෝධිත වාර්ෂික ස්ථාන මාරු යෝජිත ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීමේදී ශ්‍රේණි ජ්‍යෙෂ්ඨතාවය පිළිබඳව ගැටලු තිබේ නම් එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු වන අතර අයදුම්පත් කැඳවීමෙන් පසුව කිසිඳු සංශෝධනයක් සිදු කරනු නොලැබේ.

5.4.1 අයදුම්පත් කැඳවන දින වන විට ජ්‍යෙෂ්ඨතාවය සනාථ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ශ්‍රේණි උසස් කිරීමේ ලිපි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5.5 ශ්‍රේණි වෛද්‍ය නිලධාරී වාර්ෂික ස්ථාන මාරු වලදී මධ්‍යම රජය හා පළාත් සභා යන සියල්ලෙහිම ස්ථාපිත සියලුම සෞඛ්‍ය ආයතනයන්හි වැටුප් ලේඛනයන්ට අනුකූලව සියලුම වෛද්‍ය නිලධාරීන් ඔවුන් වර්තමාන සේවා ස්ථානයන් වෙත සේවයට වාර්තා කල දිනයද ඇතුලත්ව අවශ්‍ය තොරතුරු සහ අදාල ආයතනයන්හි පවතින වාර්ෂික ස්ථාන මාරු සඳහා ඇතුලත් කළ යුතු පුරප්පාඩු අදාල ආයතන ප්‍රධානීන් මගින් ගෙන්වා ගනු ලබන අතර එම තොරතුරු නිවැරදිව අදාල කාල සීමාවන් තුලදී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කිරීම අදාල ආයතන ප්‍රධානීන්ගේ වගකීමකි.

5.6 ගෙන්වා ගත් තොරතුරු පදනම් කර ගනිමින් වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන් යටත් වන වෛද්‍ය නිලධාරීන්ගේ නාම ලේඛණය, වසර 02 සම්පූර්ණ වීම මත සිය කැමැත්ත ප්‍රකාශ කල නිලධාරීන්ගේ නාම ලේඛණය සහ පුරප්පාඩු ලේඛණය සකස් කර ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙහිදි වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන් යටත් වන වෛද්‍ය නිලධාරීන් නිසා ඇතිවන පුරප්පාඩු හැර අවම අතිරේක පුරප්පාඩු සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

5.6.1.අතිරේක පුරප්පාඩු ලැයිස්තුව සඳහා වසරකට වඩා වැටුප් රහිත නිවාඩු ලබා ඇති වෛද්‍ය නිලධාරින්ගේ තනතුරු ද, සේවය හැර ගිය/සේවයෙන් ඉල්ලා අස් වූ හා සේවයෙන් විශ්‍රාම ගැන්වී ඇති වෛද්‍ය නිලධාරින්ගේ තනතුරු ද, පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය වෙත මුදා හරින ලද වෛද්‍ය නිලධාරින්ගේ තනතුරු ද අතිරේක පුරප්පාඩු ලෙස සලකා එම පුරප්පාඩු මෙම ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ.

5.7 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අනිවාර්යයෙන්ම යටත් වන ශ්‍රේණි වෛද්‍ය නිලධරයන් උක්ත ලැයිස්තුවෙහි තමාගේ නම ඇතුලත්ව තිබේද යන්න පිලිබඳව විමසා එසේ ඇතුලත්වී නොමැති නම්, තම ආයතන ප්‍රධානියා මඟින් නම ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වේ.

5.8 වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම් කිරීමේදී ඒ සඳහා සකස් කල අන්තර්ජාල අයදුම්පත මඟින් පමණක් අයදුම් කළ යුතු අතර, එයට සමගාමීව සම්පූර්ණ කළ අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5.9 ස්ථාන මාරුවීම් අයදුම් කරන වෛද්‍ය නිලධරයන් අයදුම්පත් කැඳවන අවස්ථාවේ ප්‍රසිද්ධ කරනු ලබන පුරප්පාඩු ලේඛණය සහ වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන් යටත් වන වෛද්‍ය නිලධාරීන්ගේ නාම ලේඛණය පුරප්පාඩු සේ සලකා ඒ අනුව තමන් ස්ථාන මාරුවී යාමට අපේක්ෂා කරන ආයතන හා එහි තනතුරුද සමඟ තමන්ගේ මනාපය අනුපිළිවෙලින් දැක්වෙන පරිදි සඳහන් කල යුතු අතර, තමාගේ ජ්‍යෙෂ්ඨතාවයට අනුකූල වන පරිදි ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් සඳහන් කල යුතු වේ.

5.10 තමාගේ වර්තමාන සේවා ස්ථානය වෙතටම යලි ස්ථාන මාරුවීම් අයදුම් කලද එවැනි ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

5.10.1 පශ්චාත් උපාධි පාඨමාලා අවසන් කිරීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යංශය වෙත වාර්තා කරන වෛද්‍ය නිලධාරීන් සහ වැටුප් රහිත නිවාඩු අවසන් කොට යලි සේවයට වාර්තා කරන වෛද්‍ය නිලධාරීන් ආසන්නතම වාර්ෂික ස්ථාන මාරුවලට යටත්ව තාවකාලිකව අනුයුක්ත කිරීමට පත්වීම් බලධාරියා හෝ අභිනියෝජන බලයක් සහිත නිලධාරියකු විසින් පියවර ගනු ලැබේ. යම් හේතුවක් නිසා මෙම වෛද්‍ය නිලධාරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් නොකලහොත් පහත 5.11 වගන්තිය අනුව ක්‍රියා කරනු ඇත.

5.11 වාර්ෂික ස්ථාන මාරු සඳහා අනිවාර්යයෙන් යටත් වන නමුත් ඒ සඳහා අයදුම් නොකල වෛද්‍ය නිලධාරීන් සහ ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් සඳහන් නොකල වෛද්‍ය නිලධාරීන් හට ස්ථාන මාරු කමිටුවෙහි තීරණය අනුව පුරප්පාඩු ලේඛනයෙහි සඳහන් කිසියම් ආයතනයක් වෙත ස්ථාන මාරු නියෝගය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

5.12 එම නියෝගය සමාලෝචන කාලසීමාව තුලදී සමාලෝචන ඉදිරිපත් කිරීමෙන් පසු වෙනස් කර ගැනීමට අදාල නිලධරයා හට ඉඩ ප්‍රස්තාවක් ලැබෙන අතර ඒ පිළිබඳ අවසන් තීරණය සමාලෝචන කමිටුව සතුවේ.

5.13 යම් වෛද්‍ය නිලධාරියෙකු පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා මුදාහලහොත් හෝ විශ්‍රාම ගතහොත් හෝ රාජ්‍ය සේවයෙන් ඉවත් වුවහොත් හෝ යම් වෙනත් කරුණක් නිසා යම් තනතුරක වසර මැදදී ඇතිවන පුරප්පාඩුව ඊලග වසරේ වාර්ෂික ස්ථාන මාරු මගින් හෝ විශේෂිත ලැයිස්තුවක් මගින් පිරවීමට කටයුතු කරනු ලබන අතර එතෙක් වඩාත් සුදුසු වෛද්‍ය නිලධාරියෙකු මගින් එම තනතුර ආවරණය කර ගැනීමට ආයතන ප්‍රධානියා කටයුතු කල යුතුය.

5.14 ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් නියමිත කාලය තුළ අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව සංශෝධිත යෝජිත නාම ලේඛනය නිකුත් කිරීමෙන් පසු එහි සඳහන් යම් පුරප්පාඩු ඉවත් කිරීම හෝ නැවත ඇතුලත් කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ සිදු නොකෙරේ.

5.15 සේවා කාලය ගණනය කිරීම.

(අ) සේවා කාලයන් ගණනය කිරීමේදි යම් ආයතනයක අවුරුදු හතරක කාලයෙහි ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ ස්ථාන මාරු නියෝගය බලාත්මක වන වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයයි.

(ආ) වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී අවුරුදු හතරක සේවා කාලයේ අවසන් දිනය ගණනය කරනු ලබන්නේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

(ඇ) යම් ආයතනයක සේවා කාලය ගණනය කිරීමේදී එම ආයතනයෙහි කුමන ඒකකයක හෝ කුමන තනතුරක සේවය කළ ද එම ආයතනයෙහි අඛණ්ඩව සේවය කළ සේ සලකා මුළු සේවා කාලය ගණනය කරනු ලැබේ.

5.16 සේවා ස්ථාන වර්ගීකරණය අදාළ නොවේ.

5.17 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන්

(අ) වාර්ෂික ස්ථාන මාරු සඳහා යෝජනා වන වර්ෂයේ ජනවාරි 1 වන දින වන විට අවුරුදු 60 ඉක්ම වූ ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්හට විශ්‍රාම ලබා ගන්නා තෙක් වර්තමාන සේවා ස්ථානයෙහිම රැදී සිටීමට අදාල ආයතන ප්‍රධානියා හරහා ඉල්ලීමක් කල යුතු වේ. මෙම වයස රජයේ ප්‍රතිපත්තිමය තීරණය අනුව වෙනස් විය හැකිය.

(ආ) වාර්ෂික ස්ථාන මාරු සඳහා යෝජිත වෛද්‍ය නිලධරයා සේවයට වාර්තා කොට ඇත්තේ පශ්චාත් සීමාවාසික පත්වීමකින් නම්, එම වෛද්‍ය නිලධරයාගේ මනාපය පරිදි සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි 01 දින සිට වසර 4ක සේවයක් සම්පූර්ණ වනතුරු වර්තමාන සේවා ස්ථානයෙහි රැදී සිටීමට හෝ ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට ඉඩ ප්‍රස්තාව ලබාදේ. අදාළ වෛද්‍ය නිලධරයා වර්තමාන සේවා ස්ථානයෙහි වසර 04 ක් සම්පූර්ණ කොට තිබේ නම් ඉදිරි වසරේ ස්ථාන මාරුවීම් සඳහා අනිවාර්යයෙන් යටත් වන අතර, වසර 2 සම්පූර්ණ කර තිබේ නම් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලබයි.

6. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 1) හි **XVIII** පරිච්ඡේදයේ **252, 253, 254** වගන්තිවල විධි විධානවලට සහ මෙම ස්ථාන මාරු පරිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව,

| කාල රාමුව | කාර්යය |
|---|---|
| මැයි මස 30 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජිත ලැයිස්තුව සඳහා තොරතුරු ගෙන්වා ගැනීම. |
| මැයි මස 15 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව සහ සමාලෝචන කමිටුව සඳහා අනුමැතිය ලබාගැනීම. |
| ජූනි මස 01 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම. |
| ජූනි මස 15 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජිත ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම සහ ලැයිස්තුවෙහි සංශෝධන ගෙන්වා ගැනීම. |
| ජූනි මස 30 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම නිකුත් කිරීම. |
| ජූලි මස 31 දිනට හෝ එදිනට පෙර | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධරයා වෙත ඉදිරිපත් කිරීම. |
| අගෝස්තු මස 10 දිනට හෝ එදිනට පෙර | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාර දීම. |
| අගෝස්තු මස 31 දිනට හෝ එදිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධරයා වෙත ලිඛිතව භාර දිම. |
| සැප්තැම්බර් මස 15 දිනට හෝ එදිනට පෙර | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම. |
| සැප්තැම්බර් මස 30 දිනට පෙර | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය. |
| ඔක්තෝබර් මස 15 දිනට හෝ එදිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධරයා වෙත ලිඛිතව භාර දීම. |
| නොවැම්බර් මස 01 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරුවීම් අවසාන නියෝග නිකුත් කිරීම. |
| නොවැම්බර් මස15 දිනට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| ජනවාරි 01 දින සිට | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. |

## 7. වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට අභියාචනා ඉදිරිපත් කිරීම

7.1 යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන නිලධාරීන්ගේ අභියාචනා.

7.1.1. යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ඒ සඳහා සෑහීමකට පත්නොවන නිලධාරීන් හට අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත කාලසීමාවක් ලබාදෙනු ලැබේ, එම කාලසීමාව තුලදී ඔවුන්ට අයදුම් කළ හැකි පුරප්පාඩු ලේඛනයද ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම අයදුම්පත්‍ර වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

7.1.2. සමාලෝචන කමිටුවේ තීරණ ඇතුලත්ව අවසන් වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුව සකස් කරනු ලබන අතර එය අනුමැතිය සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, සෞඛ්‍ය සේවා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

7.1.3.එම අවසන් නිවේදනය අනුව ලැබෙන ස්ථාන මාරු නියෝගයටද යම් නිලධාරියකු සෑහීමකට පත් වන්නේ නැතිනම්, පහත 7.2. වගන්ති වලට අනුව එම නිලධරයා හට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට (රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 256 වගන්තිය අනුව) අභියාචනාවක් ඉදිරිපත් කල හැක.

7.1.4.යම් නිලධරයකු අභියචනා ඉදිරිපත් නොකරන්නේ නම්, එම නිලධරයා යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝගය පිළිබඳව සෑහීමකට පත්වේ යැයි සලකා කටයුතු කරනු ලැබේ.

7.2 වාර්ෂික ස්ථාන මාරු තීරණවලට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

7.2.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියමයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ඇමුණුම 01 ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2.2 ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සිය වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයන් ඉදිරිපත් කළ හැකි අතර ම එය නිසි බලධරයා මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු වන්නේය. ඒ අනුව වෛද්‍ය නිලධරයා විසින් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අප්‍රමාදව ඇමුණුම අංක 02 හි ආකෘතිය සමඟින් සෞඛ්‍ය සේවා කමිටුව මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.2.3 සෞඛ්‍ය සේවා කමිටුව විසින් කරන ලද ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරුකිරීමේ නියමය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.2.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය, අදාළ සියළු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණ හා නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානියා හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය.



ගබ

එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාල ලිපිගොනු, ලිපිලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.2.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා නොබලන්නේය.

7.2.6 ඉහත 7.2.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.2.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපතක් අදාළ පරිදි අමාත්‍යාංශයේ ලේකම් හා ආයතන ප්‍රධානීන් වෙත යවනු ලබන්නේය.

7.2.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධි විධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය.

## 8. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම.

8.1. වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් අදාල ස්ථාන මාරු නියෝගය බලාත්මක වන වර්ෂයේ ජනවාරි මස පළමු වන (01) දින නව සේවා ස්ථානය වෙත සේවයට වාර්තා කළ යුතු වේ.

8.2. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින වෛද්‍ය නිලධාරියෙකු නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරි කටයුතු භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් ඔහු කල් වේලා ඇතිව නිදහස් කිරීමට ආයතන ප්‍රධානී විසින් ක්‍රියා කළ යුතු වන්නේය. එසේම නියමිත පරිදි නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීම, ස්ථාන මාරු නියෝගය ලද වෛද්‍ය නිලධරයාගේද වගකීමක් වන්නේය.

8.3. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා ඇති වෛද්‍ය නිලධරයෙකු තම ආයතනයෙන් මුදාහැරීම සඳහා අදාළ අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් නොසිට ඔහුගේ රාජකාරි කටයුතු ආවරණය කිරීමට තාවකාලික වැඩ පිළිවෙළක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට ආයතන ප්‍රධානියා ක්‍රියා කළ යුතු වන්නේය. අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් පමා නොකොට ස්ථාන මාරු නියෝගය ලද රජයේ වෛද්‍ය නිලධරයා හට නියමිත දිනයේදී නව සේවා ස්ථානයට රාජකාරි සඳහා වාර්තා කිරීමට හැකි වන ආකාරයට තම කාර්යාලයෙන් මුදාහැරීමට ආයතන ප්‍රධානියා වග බලා ගත යුතු වන්නේය.

8.4. තම කාර්ය මණ්ඩලයේ නිලධරයෙකු වෙත වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලද වහාම ඔහු භාරයේ ඇති ලිපිගොනු, ලිපිලේඛන, රජය සතු අනෙකුත් දේපල, යතුරු, පරිගණක මුරපද හා රාජකාරි හැඳුනුම්පත ආදිය ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වන දිනයට ප්‍රමාණවත් කාලයකට පෙරාතුව භාරදීමට අවශ්‍ය විධි විධාන යෙදීම ආයතන ප්‍රධානියා විසින් කළ යුතු වන්නේය. එසේම තමන් භාරයේ ඇති එවැනි සියලු දෑ යථා පරිදි භාර දීම සඳහා අවශ්‍ය විධි විධාන තම ප්‍රධානියා හා සාකච්ඡා කර සලසා ගැනීම වාර්ෂික ස්ථාන මාරු නියෝගය ලද වෛද්‍ය නිලධරයාගේ වගකීම වන්නේය.

8.5. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින වෛද්‍ය නිලධාරියෙකු සිය කැමැත්තෙන් තනතුරු අතහැර ගියා සේ සළකා මෙම කාර්ය පරිපාටික රීති සංග්‍රහයෙහි XV වැනි පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කිරීම, අදාල පරිදි නව ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේය.

8.6. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින නිලධාරියෙකු නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් ලෙස මුදා හැරීමට කටයුතු නොකරන බලධරයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම, අදාළ විනය බලධරයන්ගේ වගකීම වන්නේය.

## 9. ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධරයන් සඳහා වූ විශේෂ අභියාචනා ස්ථාන මාරු

### 9.1. හැඳින්වීම

උක්ත ස්ථාන මාරු ක්‍රමවේදය, වාර්ෂික ස්ථාන මාරු හා සම්බන්ධ නොවන, ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහාම විශේෂිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 268 සිට 271 හි දැක්වෙන විධි විධානයන්ට අනුව සිදු කරනු ලබන ස්ථාන මාරු ක්‍රමවේදයකි

### 9.2. අයදුම්පත් ලබා ගැනීම සහ යොමු කිරීම

වෛද්‍ය නිලධරයන් විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කර, සේවා ස්ථානයේ ආයතන ප්‍රධානීන් විසින් නිර්දේශිත එහි දෘඩ පිටපත සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලද වහාම ඔහුගේ නිර්දේශ සහිතව යොමු කිරීම.

### 9.3. ස්ථාන මාරු නිර්දේශ කිරීමේ නිර්ණායක.

9.3.1. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2017.05.05 දින පැවති සාකච්ඡාවේ එකඟතාවය සහ සෞඛ්‍ය සේවා කමිටුව විසින් වරින් වර කරන ලද නිර්ණායක සංශෝධනයන්ටද අනුව පශ්වාත් සීමාවාසික පත්වීම් මගින් හෝ ස්ථාන මාරු නියෝගයක් මගින් සේවය සඳහා වාර්තා කර, එම සේවා ස්ථානයේ සක්‍රිය සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කර ඇති ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධරයන් , මේ සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකම් ලබයි (තාවකාලික ස්ථාන මාරු නියෝග, පශ්වාත් උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවන් සම්පූර්ණ කිරීම සඳහා වන ස්ථාන මාරු ඉල්ලීම් මේ සඳහා බලාත්මක නොවේ).

9.3.2. එහෙත් එලෙස යොමු කරන අයදුම්පත් සඳහා නිර්දේශ ලබා ගැනීමේදී සෞඛ්‍ය සේවා කමිටුව වරින් වර ලිපි මගින් ලබා දී ඇති උපදෙස්ද පදනම් කර ගනිමින්, පහත සඳහන් නිර්ණායකයන් අනුව, වාර්ෂික ස්ථාන මාරු යටතේ සහන සැලසීමට හැකියාවක් නොමැති, ලේඛන මගින් තහවුරු වන හේතු මත, ඉදිරිපත් කරනු ලබන ඉතාමත් සුවිශේෂී, සාධාරණීකරණය කළ හැකි සහ හදිසි ස්ථාන මාරු ඉල්ලීම් සාධාරණීකරණයන් හා නිර්දේශ සහිතව එම අයදුම්පත් වෙන වෙනම පුද්ගලික ඉල්ලීම සේ සලකා, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලද වහාම සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශයන් ද සහිතව සෞඛ්‍ය සේවා කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

9.3.3. වාර්ෂිකස්ථානමාරු / දුෂ්කර සේවා ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබා ඇති හෝ දැනටමත් ක්‍රියාත්මක නොවූ ස්ථාන මාරු නියෝගයක් මත සිටින නිලධාරීන් මේ සඳහා සුදුසුකම් නොලබන අතර, එහෙත් එවැනි ඉල්ලීම්ද අතිශය පෞද්ගලික ඉතාමත් සුවිශේෂී සහ හදිසි ඉල්ලීම් පමණක් වේ නම් සාධාරණීකරණය අනුව නිර්දේශ කර යොමු කිරීම.

9.3.4. අයදුම්කරු/කාරියගේ, කලත්‍රයාගේ හෝ දරුවන්ගේ බරපතල රෝගී තත්වයන් මෙන්ම දෙමාපියන්ගේ රෝගී තත්වයන් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ වාර්තා මගින් සනාථ වන්නේ නම් සහ පෞද්ගලික ගැටළු සම්බන්ධයෙන් යොමු කර ඇති අයදුම්පත් සම්බන්ධයෙන්ද සාධාරණීකරණය කර නිර්දේශ ලබාදීම සඳහා දක්වා ඇති බරපතල රෝගී තත්වයන් සනාථ කිරීමට මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර අදාළ වෛද්‍ය වාර්තාවන්හි සහතික කළ පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය. (ආකෘත්රි පත්‍ර 1).

9.3.5. නිලධරයා වර්තමාන ස්ථිර සේවා ස්ථානයේ සේවා කාලය වසරක් සම්පූර්ණ කල යුතුය. අයදුම්කරු/කාරියගේ, කලත්‍රයාගේ හෝ දරුවන්ගේ බරපතල රෝගී තත්වයන් සහ පෞද්ගලික ගැටළු සම්බන්ධයෙන් මෙන්ම අවිවාහක අයදුම්කරුවන්ගේ දෙමාපියන්ගේ බරපතල රෝගී තත්වයන් සම්බන්ධයෙන් යොමු කර ඇති අයදුම්පත් සඳහා සාධාරණීකරණය කර නිර්දේශ ලබා දීම සඳහා දක්වා ඇති බරපතල රෝගී තත්වයන් සනාථ කිරීම මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර අදාළ වෛද්‍ය වාර්තාවන්හී සහතික කළ පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය. (ආකෘති පත්‍ර 1).

9.3.6. ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධරයෙකුට තම සේවා කාලය තුළ විශේෂ අභියාචනා ස්ථාන මාරු සඳහා අයදුම් කළ හැකි වන්නේ එක් වතාවක් පමණි.

9.4. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නිර්දේශ සහ ප්‍රති අභියාචනා යොමු කිරීම.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් වරක් ලබා දුන් තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන නිලධාරීන්ට, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ප්‍රතිඅභියාචනා කළ හැකි බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ අංක **HSC/APP/MS/01/02/2017** හා **2018.01.19** දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර ඒ අනුව ලැබෙන ප්‍රති අභියාචනා යොමු කිරීම කළ යුතුය.

9.5. ස්ථාන මාරු නියෝග අනුව නිලධාරීන් මුදා හැරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද තීරණය සහ නිලධරයාගේ සේවා ස්ථානයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් අනුව පශ්චාත් සීමාවාසික පත්වීම් මඟින් අනුප්‍රාප්තිකයන් යොදා ගෙන, සේවය අඛණ්ඩව පවත්වාගෙන යා හැකි පරිදි ස්ථානමාරු ක්‍රියාත්මක කරනු ලැබේ.

## 10. <u>ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වූ ඌණ පහසුකම් සේවා ස්ථාන මාරු</u>

10.1. පූර්ව නිශ්චිත නිර්ණායකයන්ට අනුකූලව වාර්ෂිකව ඌණ පහසුකම් සේවා ස්ථාන ලැයිස්තුවක් නම් කරනු ලැබේ. එම ලැයිස්තුවට ඇතුලත්වන සෞඛ්‍ය ආයතනයන් වාර්ෂිකව සංශෝධනය විය හැකි අතර, එම සේවා ස්ථාන නාමලේඛනය වලංගුවන්නේ එම අවස්ථාවේදී ස්ථාන මාරු අයදුම්කර සිටින පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරී කණ්ඩායම සඳහා පමණක් වේ.

10.1.1 පූර්ව නිශ්චිත නිර්ණායකයන් පහත පරිදි වේ.

I. කුමන ආයතනයක් ද යන වග - (ඒක පුද්ගල සේවා ස්ථාන, සේවා ක්‍රියාත්මක වන කාලය, අයදුම්කරුවන් ගණන අනුව තීරණය වන ස්ථානයේ ජනප්‍රියතාවය - ස්ථාන මාරු අයදුම්කරන ප්‍රමාන හා පසුගිය වසර වලදී පුරප්පාඩු පැවතීම).

II. ප්‍රාදේශීය සභාවට අයත් නගරයට රෝහලේ සිට ඇති දුර 15km ට වඩා වැඩි වීම.

III. පොදු ප්‍රවාහන පහසුකම් දිනකට 4 වරක් වත් තිබීම. (ප්‍රාදේශීය සභාවට අයත් නගරයේ සිට).

IV. රෝහලට ප්‍රවේශවන මාර්ගවල තත්වය,

a. සාමාන්‍ය වාහන ගමනාගමනය නොවන හෝ මුහුදු මඟින් ප්‍රවේශ මාර්ග.
b. තාර යොදා ඇති නමුත් අසම්පූර්ණ ලෙස සකස් කළ ප්‍රවේශ මාර්ග.
c. තාර නොයොදා ඇති ප්‍රවේශ මාර්ග.

V. අවම පහසුකම් තිබීම.

උදා - පානීය ජලය, නල ජලය, විදුලිය, සනීපාරක්ෂක සහ නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොවීම.

VI. විවිධ උපද්‍රව තිබීම - වන සතුන්, නාය යෑම් වැනි ස්වභාවික උපද්‍රව.

VII. පාසලකට පවතින දුර 15km ට වඩා තිබීම.

10.2. පශ්චාත් සීමාවාසික පත්වීම් යටතේ ඉහත කී සෞඛ්‍ය ආයතන වලටද වෛද්‍ය නිලධාරීන් අනුයුක්ත කෙරේ.

10.3. පශ්චාත් සීමාවාසික පත්වීම් ලද සෙසු වෛද්‍යවරුන් වසර 4 ක කාලයක් තම සේවා ආයතනයේ සේවය කළ යුතු වුව ද ඌණ පහසුකම් සේවා ස්ථාන පත්වීම් ලද වෛද්‍ය නිලධාරීන් හට අවම වසර 2 ක සක්‍රිය සේවා කාලයකින් පසුව ඌණ පහසුකම් සේවා ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමේ හැකියාව පවතී.

10.4. අදාල ස්ථාන මාරු අයදුම්පත් කැඳවා අවසන් වූ වහාම පුරප්පාඩු ලේඛනයක් සකස් කර වසර 02 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද වෛද්‍ය නිලධාරීන්ගේ අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

10.5. පශ්චාත් සීමාවාසික පත්වීමේ දී ලබා දී තිබූ කුසලතා පදනම මෙම ස්ථාන මාරු වීම් සඳහා ද බලපානු ලැබේ.

10.6 යම් වෛද්‍ය නිලධාරියෙකු සිය පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරී කණ්ඩායමට අදාල ඌණ පහසුකම් සේවා ස්ථාන ලේඛනය යටතේ අයදුම්පතක් ඉදිරිපත්කිරීමට අපොහොසත් වන්නේ නම් ඒ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත්කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

## 11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

සකස් කළේ - ..............................
අත්සන - ..............................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම - ..............................
තනතුර - ..............................
දිනය - 11 | 11 | 2023

සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය" කොළඹ 10.

පරීක්ෂා කළේ - ..............................
අත්සන - ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම - ..............................
තනතුර - ..............................
දිනය - ..............................

විශේෂඥ වෛද්‍ය සමිද්ධි සමරකෝන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
කොළඹ 10

අත්සන - .................... නම - ....................

(දේපාර්තමේන්තු ප්‍රධානියා)

දිනය - 2025.11.12

නිල මුද්‍රාව - වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

යොමු අංකය :- PSC/EST/3/4/1/2013

2025/08/27 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයේ **SL-02-2016** වැටුප් කේතය අයත් සේවා ගණයේ ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන - ....................

නම - .................... විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ලේකම්**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

දිනය - 2025/11/14

නිල මුද්‍රාව - ....................

**12. ~~අමාත්‍යාංශයේ නිර්දේශය~~**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයේ **SL-02-2016** වැටුප් කේතය අයත් සේවා ගණයේ ශ්‍රේණිධාරී වෛද්‍ය නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය 2025/08/27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

අත්සන - ....................

නම - ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

**ලේකම්**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

දිනය - 2025/12/12

නිල මුද්‍රාව - ....................

ආකෘති පත්‍ර 01

## විශේෂ අභියාචනා ස්ථාන මාරු ලබා දීමේ දී සලකා බලනු ලබන බරපතල රෝගී තත්වයන්

## පිළිබඳ ආකෘති පත්‍රය

| රෝගයේ ස්වභාවය | රෝගියා | | | | ප්‍රතිකාර කරනු ලබන කාල සීමාව | අමුණා ඇති ලේඛන | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අයදුම්කරු | ස්වාමියා/ බිරිඳ | දරුවන් | දෙමාපියන් | | සායනික සටහන් | පරීක්ෂණ වාර්තා | විශේෂඥ වෛද්‍ය නිර්දේශ |
| | | | | | | | | |